# ගෘහස්ථ සිනමා පද්ධතිවල (Home Theater)



**10. HYBRIDS**
මෙවැනි අතේ රැගෙන යා හැකි උපකරණ අනපේක්ෂිත රටාවන්ගෙන් පැමිණෙනු ඇත. Sony සමාගමේ මීළඟ නිෂ්පාදනය වන අතේ රැගෙන යා හැකි ක්‍රීඩා උපකරණය (Play Station) "GPS"අංගයකින් හා යතුරු පුවරුවකින් ද සමන්විතය.

**9. PATIO SCREEN**
මෙය මීටර් 5 x 4 ප්‍රමාණයෙන් යුත් ඇතුළු මිදුලේ තැබිය හැකි චිත්‍රපට තිරයකි. අදට පවතින ඒවා DVD යන්ත්‍රයකින් සමන්විත අතර නවතම ඒවා රැහැන් රහිතව සම්බන්ධ වනු ඇත.

**8. PC'S AS TV'S**
ලෝකයේ ඕනෑම තැනක සිට, සිය මේසය මත හෝ උකුල මත වූ පරිගණකයක ආධාරයෙන් තමා කැමතිම රූපවාහිනී වැඩසටහන නැරඹීමට මෙමඟින් අවස්ථාව සැලසේ.

**7. GAMES TO GO**
මෙවැනි බහු ආංගික තිර මඟින්, පිටත සිටින අවස්ථාවලදී පවා දිගටම ක්‍රීඩාවෙහි යෙදීමට ක්‍රීඩාවෙහි නිරත වන්නාට අවස්ථාව උදා වේ.



නිවසේදී අපට විනෝදාස්වාදය සපයන බොහෝ යන්ත්‍ර අද ක්‍රියාත්මක වන්නේ රැහැන් සම්බන්ධතාව තුළිනි. එලෙසම පවුලේ සැවොම අදටත් බොහෝමයක් වැඩසටහන් රූපවාහනී යන්ත්‍රයක් ඉදිරිපිට සිට නරඹන්නේ එකට එකතුවී ය. එහෙත්, නූතන ලෝකය දැන් කැබලිවලට කැඩී ගොසිනි. බාගත කිරීම් (down load) ආදිය ද අද වඩාත් පහසු වී තිබේ. ස්ටූඩියෝවේ සිට නිවස කරා, චිත්‍රපට, සංගීතය, වීඩියෝ ක්‍රීඩා ආදිය කෙළින්ම ලබාගත හැකි තත්ත්වයක් පාරිභෝගිකයාට අද උදාවී තිබේ. තාක්ෂණයේ දියුණුවත් සමඟ විශිෂ්ටවූත්, විශාලවූත් පැහැදිලි තිර නිපදවීමේ ප්‍රතිඵලය, ඔබේ නිවසත් චිත්‍රපට ශාලාවක් නැතහොත් නෘත්‍ය ශාලාවක් බවට පත්වීමය. තමාට ඇවැසි දේ එකම නිවස තුළ වෙන් වෙන් තැන්වල සිට නැරඹීමේ අවස්ථාව පවුලේ සාමාජිකයනට මෙහිදී උදාවනු ඇත. ඒ අනුව, දැනටමත් ඔබේ නිවස ආක්‍රමණය කර ඇති උපකරණ කීපයක් මෙහි දැක්වෙනු ඇත.

# අනාගතය



**1. SATELLITE LINK**

නව MPEG - 4 සම්පීඩක ක්‍රමය, මඟින් ප්‍රමාණයෙන් වැඩි ලිපි ගොනු පවා චන්ද්‍රිකාවක සිට සර්වරය(Server) වෙත ක්ෂණිකව බාගත කරගත හැකි වේ.

**2. CONNECTIVITY**

මෙම පද්ධතිය ස්වායත්තව පහසුවෙන් ක්‍රියාකිරීමට ඉඩ සලසා දෙන, විශ්වාසදායී රැහැන් රහිත සබඳතාවකි. මෙම රැහැන් රහිත පාලකය, මයික්‍රොසොෆ්ට්, පිලිප්ස් හා ඉන්ටෙල් සමාගම් මඟින් සැපයෙනු ඇත.

**3. CONTROLS**

රැහැන් රහිත පුවරුව (tablet) භාවිතයෙන් නිවසේ තිබෙන ඕනෑම කාමරයක් හෝ පිටත පාලනය කිරීමට හැකි වේ.

**4. MEDIA SERVER**

නිවසේ විනෝදස්වාදය සපයන කේන්ද්‍රස්ථානයයි. සෑම වසරකදීම නව රූපවාහිනී වැඩසටහන් පැය මිලියන 31 ක් නිෂ්පාදනය කෙරේ. එම විසුරුවාහැරීම් වෙබ් අඩවිය හරහා හුවමාරු කර ගබඩා කර තැබීමට මෙම විශාල දෘඪ තැටිය මඟින් භාවිත කරන්නාට අවස්ථාව උදා වේ.

**5. 3-D SCREEN**

ගුවනේ පාවෙන්නාක් මෙන් දිස්වන මෙවැනි තිර නිවසේ ඕනෑම ස්ථානයක ස්ථානගත කළ හැකිය. කලබලකාරී ස්ථානවල පවා තැබිය හැකිවීම විශේෂත්වයකි.

**6. HOLO - SCREN**

එක ළඟ වාඩිවී වෙනස් වූ වැඩසටහන් එකම තිරය මත නැරඹීමට, ද්විත්ව හොලෝග්‍රෑම තිරයක් මඟින් අවස්ථාව උදාවනු ඇත.

නිව්ස්වීක් ඇසුරෙනි - ලලනී